## විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

01. සියලු සැපයුම්කරුවන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශය මගින් ලබාදෙන අයදුම්පත හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් අඩවියෙන් (www.slbfe.lk) බාගත කරන ලද අයදුම්පතහි සඳහන් ආකෘති පත්‍රයට අනුවම සකස් කල අයදුම්පතක් භාවිතා කල යුතුය.(එසේ සකස් නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

02. 2020.12.07 වන දින සිට 2020.12.27 දින දක්වා රාජකාරි දිනයන්හිදී පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශයෙන් අයදුම්පත් නිකුත් කිරීම සිදුකරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2020.12.28 දින ප.ව 1.00 දක්වා පමණක් වේ.(මින් පසුව ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.)

03. ප්‍රසම්පාදන අංශයෙන් අයදුම්පත් ලබාගන්නේ නම් ඒ සඳහා අදාල ආයතනයේ ලිපි ශිර්ෂයක අයදුම්පතක්/අයදුම්පත් ලබාදෙන ලෙස ඉල්ලමින් නිකුත් කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

04. සෑම අයිතමයක් (භාණ්ඩයක් හෝ සේවාවක්) සඳහාම ආපසු නොගෙවනු ලබන රු. 1000/- ක මුදලක් (මුදලින් පමණක් ගෙවීම් කල හැක.) අයකරන අතර, ඒ සඳහා කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ හෝ ඕනෑම ශාඛා කාර්යාලයකින් බැංකු පිළිපත් (Bank slips) ලබා ගත හැකි අතර, එම මුදල දිවයිනේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා එම බැංකු පිළිපත් (Bank slips) අදාල අයදුම්පත සමග අමුණා එවිය යුතුය. (උපලේඛනයේ සඳහන් එක් අයදුම් අංකයක් සඳහා එක් බැංකු පිළිපතක් (Bank slips) පාවිච්චි කල යුතු අතර සේවා අයිතම කිහිපයකට අයදුම් කරන්නේ නම් අයිතම සඳහා වෙන වෙනම බැංකු පිළිපත් (Bank slips) හා අදාල අයදුම්පත් සමග ඉදිරිපත් කල යුතුය.එසේම එම බැංකු පිළිපත් (Bank slips) නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. )

05. අයදුම් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා ඉදිරිපත් කල යුතු ලිපිලේඛන අංක **5**හි අනු අංක යටතේ දක්වා ඇත.

5.1 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද පිටපතක් අනිවාර්යය වේ.(Business Registration Certificate)

5.1.1 භාණ්ඩ හා සැපයුම් සේවා සැපයීම් සඳහා ප්‍රථමවරට තම ව්‍යාපාරය ලියාපදිංචි කළ දින සිට අවම වශයෙන් වසර 3ක් ගතවී තිබිය යුතුය.

5.1.2 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් ව්‍යාපාර ස්වභාවයට අදාල වන භාණ්ඩ හා සේවා සඳහා පමණක් අයදුම් කල යුතුය.

5.2 ගරාජයන් සඳහා ලියාපදිංචි වීමේදී, ප්‍රධාන කාර්යාලය හා අදාල ශාඛා කාර්යාල පරිශ්‍රයේ සිට කිලෝමීටර 15ක දුර ප්‍රමාණයක පිහිටි ගරාජයන් විය යුතු අතර, BRC හි සඳහන් ලිපිනයෙහි ගරාජ පිහිටා තිබිය යුතුය. (කාර්යාංශය විසින් ලියාපදිංචි කිරිමට පෙර අදාල ගරාජ් ආයතන පරික්ෂා කිරීම සිදු කරනු ලබන අතර, කාර්යාංශයේ ශාඛා කාර්යාල ලිපිනයන් කාර්යාංශ නිල වෙබ් අඩවියේ සඳහන් කර ඇත.)

5.3 උපලේඛනයේ සඳහන් අයිතම අංක 33, 34 හා 35 ඇතුලත් ඉදිකිරීම් කටයුතු සඳහා අයදුම්කරන්නන් විසින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි ලේඛණයෙන් උපුටාගත් ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

5.4 අදාළ බැංකු පිළිපත් වල කාර්යාංශ පිටපත හා මුදල් අංශ පිටපත (Bank slips) යන පිටපත් අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. (කාර්යාංශ -කොළ පැහැති පිටපත හා මුදල් අංශ -නිල් පැහැති පිටපත )

5.5 අනෙකුත් අදාල තොරතුරු

06. සියළුම ඉල්ලුම්පත් එක් කවරයක බහා ඉදිරිපත් කළ යුතු අතර මුදල් ගෙවන ලද බැංකු පිළිපත් (Bank Slips) සහ අනෙකුත් ලේඛණ සමග (මුදල් අණකර බාරගනු නොලැබේ.) 2020.12.28 දින ප.ව 1.00 ට ප්‍රථම පහත ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ භාරදිය හැකි අතර, ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුය.

07. අයදුම්කරුවන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා ඉදිරිපත් වීමේදී අවශ්‍ය අවස්ථාවලදී ණය පදනම මතද භාණ්ඩ හා සේවා සැපයීමට හැකිවිය යුතු අතර, එසේ කිරීමට එකග නොවෙන්නේ නම් එය පෝරමයේ සටහන් කල යුතු සේම, ණය ලබාදිය හැකි කාල සීමාව අදාල පෝරමයේ නිශ්චිතව දැක්විය යුතුය.

08. ලියාපදිංචිවන මෙම සැපයුම්කරුවන්ට අමතරව කාර්යාංශයට අවශ්‍ය භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව වෙනත් ක්‍රමවේද තෝරාගැනීමට කාර්යාංශයට හැකියාව ඇත.

09. අසත්‍ය තොරතුරු / ලේඛන ඉදිරිපත් කල බව පෙනී ගියහොත් කිසිදු පෙර දැනුම් දීමකින් තොරව සැපයුම්කරු, සැපයුම් ලේඛනයෙන් ඉවත් කිරීමේ බලය කාර්යාංශ ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

10. සියලු සැපයුම්කරුවන් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කල යුතුය.

11. මිල ගණන් සඳහා ලංසු ආරාධනා යොමු කල පසු ඒ සඳහා තෙවරක් (3වරක්) ප්‍රතිචාර නොදැක්වීම, ඉල්ලුම් කරන ලද සැපයුම් හා සේවාවන් නිසි වේලාවට සැපයීමට අපොහොසත් වීම සහ අනුමත සාම්පල් වලට අනුකූලව සැපයීම් නොකිරීම යන හේතුන් මත පූර්ව දැනුම් දීමකින් තොරව සැපයුම්කරුවන්ව සැපයුම් ලේඛනයෙන් ඉවත් කිරීමේ බලය කාර්යාංශ ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර මිල ගණන් ඉදිරිපත් කල නොහැකි නම් ඒ බව ලිඛිතව දැන්විය යුතුය.

12. හේතු දැක්වීමකින් තොරව 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කර ඇති කිසියම් අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති සතුය.

සභාපති
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
කොස්වත්ත, බත්තරමුල්ල

වෙබ් අඩවිය- www.slbfe.lk
දුරකතන - 0112880550 /0112887585

# උපලේඛනය

## I කොටස

**භාණ්ඩ**

1. වායුසමීකරණ යන්ත්‍ර හා අමතර කොටස්
2. පාසල් ගමන් මලු, කාර්යාලීය ගමන් මලු, අත් බෑග්, සපත්තු (කාන්තා සහ පිරිමි) සහ පිරිමි බඳ පටි
3. තිර රෙදි කුෂන් කවර හා වෙනත් රෙදිපිළි (කාර්යාලීය)
4. ඇඟිලි සලකුණු සටහන් තැබීමේ යන්ත්‍ර
5. ස්ථාවර දුරකථන හා අමතර කොටස්
6. අකුණු සන්නායක
7. බෙහෙත් ද්‍රව්‍ය හා වෛද්‍ය උපකරණ
8. විවිධ (Hardware භාණ්ඩ, Ceramic භාණ්ඩ, පිඟන් භාණ්ඩ, Water Dispenser, ජල බෝතල් ආදිය)
9. ජංගම දුරකථන
10. කාර්යාලීය හා ගෘහාශ්‍රිත ගෘහ භාණ්ඩ (දැව, වානේ, ෆයිබර් ග්ලාස්, ප්ලාස්ටික්)
11. කාර්යාලීය උපකරණ හා උපාංග (ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, මුද්දර යන්ත්‍ර, මුදල් ගණනය කිරීමේ යන්ත්‍ර ඇතුළුව)
12. කාර්යාලීය වෙන් කිරීම් සහ අවශ්‍ය ද්‍රව්‍ය
13. රාජකාරී හැඳුනුම්පත් / ඇතුළුවීමේ අවසරපත් සකස් කිරීම
14. දින මුද්‍රා/ නිල මුද්‍රා සකස් කිරීම
15. සනීපාරක්ෂක භාණ්ඩ
16. ක්‍රීඩා භාණ්ඩ
17. නිල ඇඳුම්
    17.1 කාර්යාලීය
    17.2 උපදේශන
    17.3 කාර්මික
18. ලිපිද්‍රව්‍ය
19. කුසලාන / පදක්කම්
20. ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සහ අමතර උපාංග (බහුමාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර, වීඩියෝ කැමරා හා අමතර උපාංග, BETACAM, DV Cam, Mini DV, Cassettes, CD සහ DVD නිශ්චල කැමරා සහ අමතර උපාංග, ප්‍රදර්ශනාත්මක ඒකක සහ ප්‍රදර්ශනාත්මක කාර්යයන්)
21. අත්කම් භාණ්ඩ සහ ප්‍රවර්ධන භාණ්ඩ සැපයීම (ටී ෂර්ට්, කැප්, බෑග්, පිඟන්, කුඩ, යතුරු රඳවන (Key Tag) පෑන්, තේ ඇසුරුම් ආදිය)
22. සිල්ලර බඩු / ග්‍රොසරි ද්‍රව්‍ය (සීනි,කිරිපිටි,තේ කුඩු,කෝපි)
23. ආරක්ෂිත මුද්දර සහ සහතිකපත් ආදීය මුද්‍රණය කිරීම
24. ආරක්ෂිත උපකරණ හා ද්‍රව්‍ය (උදා-මුඛ ආවරණ,මුහුණු ආවරණ,අත් වැසුම්, ආරක්ෂිත ඇඳුම්,විෂබීජ නාශක දියර හා අනෙකුත්)

## II කොටස

**සේවාවන්**

25. ප්‍රචාරක දැන්වීම් කටයුතු (බැනර් ඇදීම, නිර්මාණාත්මක කාර්යයන් (Art Work), ප්‍රදර්ශණ පුවරු, ප්‍රදර්ශණ කුටි, සෙට් ඩිසයිනින්,Digital Printing)
26. ඇලුමිනියම් සැකසීම් (දොරවල්, ජනේල, සීවිලිම්, කාර්යාලීය කාමර වෙන් කිරීමේ සේවා සහ එම ශිල්පීය සේවාවන්)
27. ආහාරපාන සංග්‍රහ කටයුතු සේවා සැලසීම
28. පවිත්‍රතා සේවා සැපයීම
29. ආරක්ෂක සේවා සැපයීම
30. කුරියර්(ර්) සේවාව සැපයිම
31. කාර්ගෝ සේවාව සැපයිම

32. ප්‍රවාහන පහසුකම් (කාර්, වෑන්, ඩබල් කැබ් රථ, බස්, ලොරි ආදිය කුලී පදනම මත සැපයීමේ සේවා)
33. ගොඩනැගිලි ඉදිකිරීම් හා අළුත්වැඩියා කටයුතු සහ උපදේශන,
34. ශිල්පීය සැපයීම් සේවා
    34.1 පෙදරේරු/ පයිප්ප වැඩ
    34.2වඩු වැඩ / දැව පොලිෂ්කරුවන්
    34.3වෙල්ඩින්කරුවන්, ලියවන පට්ටල් සේවා/ යකඩ පෑස්සුම්
    34.4ගොඩනැගිලි පින්තාරු කිරීම්/ සුළු අලුත්වැඩියා කටයුතුවිදුලි පරිපථ,
    34.5යාන්ත්‍රික උපකරණ හා සම්බන්ධ සේවාවන්/ විදුලි හා ජල මෝටර් එතීම.
35. මළ අපවහන පද්ධති ඉදිකිරීම හා අපජලය බැහැර කිරීම ආශ්‍රිත සේවා සැපයීම
36. කාර්යාලීය පුටු කුෂන් කිරීම හා කාර්යාලීය ගෘහ භාණ්ඩ අළුත්වැඩියාව
37. රේගු සේවා සැපයීම්
38. උත්සව කටයුතු සඳහා නර්තන කණ්ඩායම් සැපයීම
39. ගලි පවිත්‍ර කිරීමේ සේවා/මළ අපවහන සේවා සහ සනිපාරක්ෂක බහාලුම් සේවා
40. විදුලි හා වායු සමීකරණ කටයුතු සම්බන්ධ සේවා
41. විගණන කටයුතු සහ වෘත්තීමය උපදේශන සේවා සැපයීම
42. ගෙවතු අලංකරණය/ ගෘහස්ථ මල් පැළෑටි සැපයීමේ සේවා
43. කේබල් රූපවාහිනි සහ චන්ද්‍රිකා රූපවාහිනි පහසුකම්
44. කෘමීන්/ මදුරුවන් හා මීයන් මර්ධන සේවා
45. වීඩියෝ කිරීම, ඡායාරූප ගැනීම, සේයා පටල සේදීම හා මුද්‍රණය, ඡායාරූප රාමු කිරීම, ලැමිනේටින් කිරීමේ සේවා, ඇල්බම් සකස් කිරීම, Box Mount කිරීම
46. විදුලි සෝපාන අළුත්වැඩියා කිරීමේ සේවා
47. කාර්ය මණ්ඩල පුහුණු කිරීම (තොරතුරු තාක්ෂණ, පරිපාලන හා මානව සම්පත්, මුදල්, තාක්ෂණික, නීති, ප්‍රසම්පාදන, විගණන, භාෂා ආදී)
48. දුරකථන පද්ධති සහ මහජන ඇමතුම් සේවා
49. කම්කරු සැපයුම් සේවා
50. හෝටල් සහ රෙස්ටුරන්ට් (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය හෝ නාගරික සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහිත)
51. රක්ෂණ සමාගම් (කාර්යාලීය නිලධාරින්, විගමනික ශ්‍රමිකයින්, වාහන, ගොඩනැගිලි, කාර්යාලීය උපකරණ, විදේශ සංචාර ආදී)

## III කොටස
## වාහන අමතර කොටස් මිලදී ගැනීම, අළුත්වැඩියාව හා නඩත්තුව

52. වාහන සඳහා Audio Players, Video Players සහ Reverse Camera සැපයීම හා සවිකිරීම
53. වාහන සඳහා අමතර කොටස්
54. වාහන සඳහා වායු සමීකරණ කටයුතු
55. වාහන විදුලි පරිපථ සැපයීමේ සේවා
56. වාහන පිරිසිදු කිරීමේ සේවා කටයුතු සහ වාහන අභ්‍යන්තර පිරිසිදු කිරීමේ සේවා කටයුතු
57. වාහන අළුත්වැඩියාව (ටින්කර් කිරීම, පේන්ට් කිරීම හා යාන්ත්‍රික අළුත්වැඩියාව, Lorry Body)
58. ත්‍රීරවීල්, යතුරුපැදි සම්බන්ධ සියලුම අලුත්වැඩියා කටයුතු
59. වාහන කුෂන් කිරීමේ සේවා
60. වීල් බැලන්ස් කිරීම හා වීල් එලයිමන්ට් කිරීමේ සේවා
61. වාහන නඩත්තු කිරීමේ සේවා
62. වාහන සඳහා ටයර්, ටියුබ්, බැටරි

## IV කොටස
## තොරතුරු තාක්ෂණය සම්බන්ධ උපාංග මිලදී ගැනිම, සේවා සැපයිම සහ විදුලි උපකරණ

63. මෘදුකාංග පැකේජ (System Software and Application Software) මිලදී ගැනිම සහ අදාල සේවා සැපයීම

64. පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, පරිගණක ආශ්‍රිත සියළුම උපාංග, දෘඩාංග, ගුවන් ගමන් බලපත්‍ර කියවන යන්ත්‍ර (Passport Scanners), කාර්යාංශ ආරක්ෂිත මුද්දර කියවන (Bar code readers) යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපාංග මිලදී ගැනීම.
65. පරිගණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, පරිගණක ආශ්‍රිත සියළුම උපාංග, ගුවන් ගමන් බලපත්‍ර කියවන යන්ත්‍ර (Passport Scanners), කාර්යාංශ ආරක්ෂිත මුද්දර කියවන (Bar code readers) යන්ත්‍ර සහ ඒ ආශ්‍රිත උපාංග නඩත්තු කිරීම, අළුත්වැඩියාව සහ සේවා සැපයීම
66. Toners, Cartridges, Ribbons, Ink (පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් සහ රෝනියෝ යන්ත්‍ර සඳහා)
67. UPS යන්ත්‍ර මිල දී ගැනීම, බැටරි මිල දී ගැනීම, UPS පද්ධති සහ සේවා ලබා ගැනීම, UPS යන්ත්‍ර අළුත්වැඩියාව සහ අමතර කොටස් මිලදී ගැනීම
68. ප්‍රධාන පරිගණක (Server) මිලදී ගැනීම, අළුත්වැඩියා කිරීම Server ආශ්‍රිත සේවා සැපයීම සහ අමතර උපාංග මිලදී ගැනීම, අදාල උපදේශන සේවා ලබා ගැනීම සහ ප්‍රධාන පරිගණක ආශ්‍රිත මෘදුකාංග මිලදී ගැනීම
69. ඩොන්ගල් (Dongle) හා රැහැන් රහිත අන්තර්ජාල සම්බන්ධතා මිලදී ගැනීම
70. පරිගණක ජාලකරණය ආශ්‍රිත සේවා සහ පරිගණක ජාල ගත කිරීමේ උපාංග සැපයීම (දුරකථන කළමණාකරණ පද්ධති (PABX) ජාලකරණ කටයුතු, IP/VPN, රවුටර්, ස්විච්, පරිගණක සර්වර් පරිශ්‍ර ආශ්‍රිත සේවා, සර්වර් පරිශ්‍ර ආශ්‍රිත බිම (Floor) සැකසීම්, පරිගණක ජාලකරණ රැහැන් රහිත සහ රැහැන් සහිත සේවා සැපයීම්
71. තොරතුරු තාක්ෂණ උපදේශණ සේවා සැපයීම
72. පරිගණක මෘදුකාංග නිර්මාණය කිරීම, ස්ථාපිත කිරීම හා ඊට අදාළ සේවා සැපයීම
73. CCTV පද්ධති මිලදී ගැනීම, නඩත්තු කිරීම හා ඒ ආශ්‍රිත සේවා සැපයීම
74. විදුලි උපකරණ (විදුලි පංකා, රූපවාහිනී යන්ත්‍ර, DVD යන්ත්‍ර සහ ගෘහමය මුළුතැන්ගෙයි උපකරණ ඇතුළුව)
75. විදුලි උපාංග හා අමතර කොටස්
76. විදුලි සෝපාන සහ අමතර කොටස්
77. විදුලි උත්පාදක යන්ත්‍ර කුලියට ගැනීම සහ මිලදී ගැනීම, අළුත්වැඩියාව සහ සේවා සැපයීම
78. විදුලි/ යාන්ත්‍රික /සිවිල් උපදේශන සේවා සහ ශිල්පීය (Technical) සැපයුම් සේවා සැපයීම

## V කොටස

## අනෙකුත් සේවා

79. උත්සව සඳහා අවස්ථා කළමනාකරණ කටයුතු
80. උත්සව කටයුතු සඳහා ආලෝකකරණය/ අලංකරණ කටයුතු/ශබ්ධ විකාශන කටයුතු
81. කාර්යාලීය අලංකරණ කටයුතු
82. මාධ්‍ය උපාංග සහ සංස්කරණ කටයුතු
83. මුද්‍රණ කටයුතු (ඕෆ්සෙට් ලෙටර් ප්‍රෙස්, ඩිජිටල්, රෙදි පින්තාරු සහ ලිපි ගොනු කවර මුද්‍රණය කිරීම, දිනපොත් හා කැලැන්ඩර් මුද්‍රණය කිරීම - සඟරා, පුවත්පත්, රිසිට් පොත්)
84. සංයුක්ත තැටි කොපි කිරීම
85. යතුරු ලියන අලුත් වැඩියා කිරීම
86. භාෂා පරිවර්තන කටයුතු (සිංහල, ඉංග්‍රීසි, දෙමළ, අරාබි, කොරියානු, ජපන් සහ ඉතාලි)
87. උත්සව කටයුතු සඳහා භාණ්ඩ සැපයීම (තාවකාලික කුටි (Huts, Tents) මේස, පුටු, ශබ්ද විකාශන යන්ත්‍ර, බුමුතුරුණු, අලෝකකරණ, Podium (පෝඩියම්), කොඩි කණු ආදිය)
88. රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය, රූපවාහිනී දැන්වීම් සැකසීම, මාධ්‍ය ප්‍රචාරක කටයුතු, වීඩියෝ නිෂ්පාදනය, වීඩියෝ පට සංස්කරණය හා පටිගත කිරීම, වාර්තාමය චිත්‍රපටි සහ ටෙලි නාට්‍ය නිෂ්පාදනය කිරීම
89. අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම (කඩදාසි/කාර්යාලීය අබලි ද්‍රව්‍ය ඇතුළුව)
90. ගුවන් සමාගම්/ ගුවන් ප්‍රවේශපත්‍ර අලෙවි නියෝජිත ආයතන
91. පෙර සැකසුම් ගොඩනැගිලි (බහාළුම් සපයන්නන්)

**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021**

1. අයදුම්කරුගේ / ආයතනයේ නම : ....................................................................................................
(ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් ඇමිණිය යුතුය)

2. අයදුම්කරුගේ/ ආයතනයේ ලිපිනය : ....................................................................................
(ලබාදී ඇති ලිපිනයන්,ව්‍යාපාර සහතික පසුව වෙනස් වූයේ නම් ඒ බව ලිඛිතව ලියාපදිංචි තැපෑලෙන් ප්‍රසම්පාදන අංශය වෙත දැනුම් දීමට කටයුතු කල යුතුය.)

3. සැපයීම්/ සේවා ස්වභාවය : ..............................................................................
අයිතම අංකය : ........................ අනු අයිතම අංකය : ............................................
(අදාළ සේවාව හා අයිතම අංකය පැහැදිළිව සඳහන් කරන්න)

4. දුරකථන, ෆැක්ස් සහ විද්‍යුත් ලිපිනය
දුරකථනය : ............................................................................................................
ෆැක්ස් : ............................................................................................................
විද්‍යුත් ලිපිනය : ............................................................................................................

5. විමසීම් කළ යුතු අයගේ නම, තනතුර හා ජංගම දුරකතන අංකය
නම : ............................................................................................................
තනතුර : ..............................................................................................................
ජංගම දුරකථන අංකය : ...........................................................................................

6. ගණුදෙනු කරන ලද බැංකුකරුවන්ගේ නම් : ..........................................................................................

7. ප්‍රධාන ව්‍යාපාරික කාර්යය හා ව්‍යාපාර ස්වභාවය (සමාගමක්ද, තනි ව්‍යාපාරයක්ද යනාදි වශයෙන්) :
........................................................................................................................................

8. දැනට ව්‍යාපාරික කටයුතු ඉටු කරනු ලබන රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන (විමසීම් කටයුතු සඳහා එම ආයතන වල දුරකථන අංක ඉදිරිපත් කළ යුතුය) :
........................................................................................................................................

9. මිලදී ගැනීමේ ක්‍රියාවලිය අවශ්‍ය අවස්ථාවන්හිදී ලංසු බැදුම්කරය/ කාර්ය සාධන බැදුම්කර ඉදිරිපත් කිරීමට එකඟද යන වග:
ඔව්/ නැත : ..........................................................................................................................

10. ලබාදීමට හැකි ණය පහසුකම් (කාලසීමාව/ ප්‍රමාණය) : ..............................................................
(අවශ්‍ය අවස්ථාවලදී ලංසු සුරක්ෂණ (bid Security) හා කාර්යය සාධන බැදුම්කර (performance bond)ඉදිරිපත් කිරීමට එකග විය යුතුය.)

11. එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි අංකය (තිබේ නම්) ..........................................................

12. ලියාපදිංචි ගාස්තු ගෙවීම පිළිබඳ විස්තර - මුදල් කුවිතාන්සි අංකය: .......................................

මම/ අපි විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබා දෙන ලද පිරිවිතරයන්ට අනුව භාණ්ඩ/ සේවා ලබා දීමට මෙයින් එකඟ වෙමි/ වෙමු. එසේම, භාණ්ඩ/ සේවා පිරිවිතරයන්ට අනුව සැපයීමට මම/ අපි අපොහොසත් වුවහොත් 2021 වර්ෂයේ කාර්යාංශයේ සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයෙන් අප ආයතනය අසාදුගත කිරීමට ලක්වන බවද අවබෝධ කර ගනිමි/ ගනිමු.

අත්සන : ...................................................................

තනතුර : ...................................................................

රබර් මුද්‍රාව : ...................................................................

දිනය : ...................................................................